# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2027/13 – 2017 ජූලි මස 11 වැනි අඟහරුවාදා – 2017.07.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(2) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ ප්‍රකාශිත විනෝද කටයුතු සඳහා අය කරනු ලබන ඇතුල්වීමේ ගාස්තුවෙන් අයකළ යුතු බද්දෙහි ප්‍රතිශතය පහත උපලේඛනයේ විස්තර කරන ආකාරයෙන් පනවා 2017 සහ 2018 වර්ෂ සඳහා අය කිරීමට මහ නගර සභා ආඥාපනතේ 286අ වගන්තිය සමඟ කියවිය යුතු 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(1) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කොළඹ මහ නගර සභාවේ නාගරික කොමසාරිස්ගේ තීරණ අංක 124 දරන 2016.08.16 දිනැති තීරණය, බස්නාහිර පළාතේ ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය ඉසුර දේවප්‍රිය වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ2(2) වගන්තියේ විධිවිධාන අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඉසුර දේවප්‍රිය,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය,
මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය.

2017 ජූනි මස 27 වැනි දින,
කොළඹ 07,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ,
ශ්‍රාවස්ති මන්දිරයේ දී ය.

උපලේඛනය

| | ඛාණ්ඩය | විනෝද කටයුත්තෙහි ස්වභාවය | ප්‍රතිශතය |
|---|---|---|---|
| 01 | A | සිනමා ශාලා | 10% |
| 02 | B | විදේශීය කලාකරුවන්ගේ සියළු ප්‍රසංග සඳහා සහ Carnival සැණකෙළි | 15% |
| 03 | C | වාණිජ පරමාර්ථයෙන් පවත්වනු ලබන දේශීය ශිල්පීන් සහභාගි වන සියළු ප්‍රසංග සඳහා | 12% |
| 04 | D | DJ ප්‍රසංග, නැටුම් සංදර්ශන, Dinner Dance, Sing Alone සහ වෙනත් නැටුම් වැයුම් සහිත ප්‍රසංග/අන්තර්ජාතික ක්‍රීඩා තරග/සුබසාධක සංගම්, ආදී ශිෂ්‍ය සංගම් සහ එවැනි සමිති සංවිධාන විසින් පවත්වනු ලබන ප්‍රසංග | 10% |
| 05 | E | ක්‍රියාත්මක මට්ටමේ පවතින කලාකරුවන්ගේ සංගමයක් මූලිකව පවත්වනු ලබන ප්‍රසංග (වර්ෂයකට උපරිම ප්‍රසංග තුනකි)/දේශීය ක්‍රීඩා තරඟ | 08% |
| 06 | F | දැනට ප්‍රසිද්ධ කලාකරුවෙකු විසින් තම ජීවිතයේ විශේෂ අවස්ථාවක් ලෙස පවත්වනු ලබන ප්‍රසංග සඳහා (ජීවිතයේ එක් ප්‍රසංගයක් සඳහා පමණක් නම්)/පාසලක් විසින් පාසලේ සුබසාධනය සඳහා පවත්වනු ලබන අයදුම්කරු විදුහල්පති වන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අනුමැතිය සහිත ප්‍රසංග/පාසලක් හෝ ආදී ශිෂ්‍ය සංගමයක් හෝ විද්‍යාලයීය සංගමයක් පාසලක් වෙනුවෙන් පවත්වන ක්‍රීඩා තරග | 07% |

07 - 813

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.